# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,164 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 332 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 333 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 338 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 341 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 මාර්තු මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2020.03.05 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| දකුණු පළාත | හම්බන්තොට | තිස්සමහාරාමය | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල. | තිස්සමහාරාමය අවට | 2020.03.13 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් ද තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර පහසුකම් ද තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2020.03.05 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

එස්. ඩී. පී. ජේ. දාම්පෙගම,
සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

2020 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2020**

*ගොඩනැගිලි අයිතිකරුගේ -*

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.

3. දුරකථන අංකය : _____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : _____________.

*ගොඩනැගිල්ල -*

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : _____________.
2. මාසික කුලී මුදල : _____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : _____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : _____________.
5. භූමියේ විශාලත්වය : _____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: _____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : _____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : _____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : _____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : _____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් ම විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

_____________.
අයදුම්කරුගේ අත්සන.

02-440

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල, නිට්ටඹුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2020.04.04 පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වෙන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දින එය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් නිසි අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදින ප. ව. 3.00 ට පෙර ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරුවන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය අවස්ථාවේ දී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී ඉදිරිපත් කළ භාණ්ඩ සම්බන්ධව අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

ඒ. එම්. එන්. පී. අමරසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල - නිට්ටඹුව.

2020 ජනවාරි මස 30 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ලැයිස්තුව**

| | | |
|---|---|---|
| 01. | AR 2049/15 | N 901930 අංක දරන පා පැදිය |
| 02. | AR 1277/17 | පා පැදියක් |
| 03. | AR 191/19 | 8078 H දරන කොටස් අඩු පා පැදිය |

| | | |
|---|---|---|
| 04. | 59672 | 15 A ප්ලග් ටොප් එක හා බැටරි ක්ලිප් 02ක් සමග අඩි 52 ක් දිග වයරය |
| 05. | 61352 | මල්ටි ෂොකට් |
| 06. | 61353 | මල්ටි ෂොකට් |
| 07. | 63750 | ජල කරාමය |
| 08. | 63751 | ජල කරාමය |
| 09. | 63755 | මල්ටි ෂොකට් |
| 10. | 69689 | ජල කරාමය |
| 11. | 69674 | මල්ටි ෂොකට් |
| 12. | 69691 | මල්ටි ෂොකට් |
| 13. | AR 2008/16 | ජංගම දුරකතනය |
| 14. | AR 466/16 | ජංගම දුරකතනය |
| 15. | AR 293/17 | බන්ඩි කියත අත් කියත |
| 16. | AR 2012/17 | පිහියක් |
| 17. | 63488 | ලී ඉරුම් බංකුව |
| 18. | 55716 | රෙදි මැදීමට ගන්නා මේසය<br>රැක් කලාව<br>දිය ඇල්ල සහිත ඔරලෝසුව |
| 19. | 42832 | කිලෝ 12.5 ලිට්රෝ ගෑස් සිලින්ඩරය වට 3 හි ගෑස් ලිප් එකයි |
| 20. | 48625 | කිලෝ 12.5 ලිට්රෝ ගෑස් සිලින්ඩරය වට 3 හි ගෑස් ලිප් එකයි |
| 21. | 55710 | පුටු 2යි |

**බටු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ ලැයිස්තුව**

| | |
|---|---|
| 22. | අල්මාරිය ලී (වීදුරු) |
| 23. | පරිගණක මොනිටර් 02යි |
| 24. | පරිගණක කී බෝඩ් 03යි |
| 25. | පරිගණක (CPU) 03යි |
| 26. | පරිගණක මේසය |
| 27. | බැටරි (වාහන) 01යි |
| 28. | හෙඩ් ෆොන් කැමරා 02යි |

02-387

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ඇඹිලිපිටිය**

**රජ්‍ය සන්තක කරනු ලැබූ, හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජ්‍ය සන්තක කරනු ලැබූ නඩු අංක සහිත, අංක රහිත, මෙතෙක් කිසිවකු හිමිකම් නොකියන ලද භාණ්ඩ 2020.03.14 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන තැනැත්තකු වෙතොත් වෙන්දේසිය පවත්වනු ලබන දිනයට පෙර ලිඛිතව ඒ බව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතු අතර, එදින ප. ව. 4.00 ට පෙර එම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මුදල් ගෙවීමේ දී හා භාණ්ඩ භාර ගැනීමේ දී භාණ්ඩ මිලදී ගත් පුද්ගලයා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසි දින රාජකාරි අවසන් වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මෙම වෙන්දේසිය පිළිබඳ සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබන බව දන්වා සිටිනු ලැබේ.

කේ. පී. ආර්. ලක්මිණි විදානගමගේ,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
ඇඹිලිපිටිය.

2020 ජනවාරි මස 29 වැනි දින,
ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 1. | 68729/18 | උදලු 01<br>අලවංගු 01<br>කුඩ 02 |
| 2. | 68888/19 | සවල් 01 |
| 3. | 69297/19 | මල්ටි ප්ලග් එකක් සවි කරන ලද දිග අඩි 127 ක් වන 1.47 වර්ගයේ වයර් රෝල් 01<br>ඇම්පියර් 15 වර්ගයේ දිග අඩි 135ක් පමණ වන වයර් රෝල 01<br>අඩි 05 අඟල් 04 දිග අලවංගුව<br>අඩි 04 අඟල් 04 දිග අලවංගුව<br>අඟල් 31 ක් දිග ලී මිට සහිත උදලු 01<br>මිට අඟල් 29ක් දිග කුළු ගෙඩිය<br>ප්ලාස්ටික් තාච්චිය<br>අඟල් 10ක් දිග කල් කඩන කටුව<br>අඟල් 22ක් දිග ගල් කඩන කටුව |

| | | |
|---|---|---|
| 4. | 68109/19 | සවල් 01 |
| 5. | 69488/19 | කුඩා අලවංගු 01 |
| 6. | 68150/19 | විදුලි වතුර මෝටර් 01 |
| | | ප්ලග් පොයින්ට් 01 සහිතව වයර් රෝල් 01 |
| | | කුඩා අලවංගු 01 |
| | | මිට සහිත උදලු 01 |
| | | කුළු ගෙඩි 01 |
| | | බෝර කටු 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| | | පොඩි කුඩ 03 |
| | | අඩි 25 පමණ දිග අඟල් 02 ප්ලාස්ටික් හෝස් 01 |
| 7. | 67639/19 | ඇලුමිනියම් කල 01 |
| 8. | 70846/20 | සවල් 01 |
| 9. | 44443/17 | රෝස පාට බේසම |
| 10. | 63429/11 | සවල් 01 |
| 11. | 68034/19 | ගැරුම් වට්ටි 01 |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| | | උදලු 01 |
| | | මිටි 01 |
| | | කම්බි කුරු 01 |
| 12. | 29948/15 | කුඩා අලවංගු 02 |
| | | කුළු ගෙඩි 01 |
| | | උදලු 01 |
| | | මිටි 01 |
| 13. | 71147/20 | ගැරුම් වට්ටි 01 |
| 14. | 68044/19 | උදලු 01 |
| | | තාච්චි 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| 15. | 69935/19 | අලවංගු 02 |
| | | උදලු 01 |
| | | තාච්චි 02 |
| 16. | 67023/19 | Camry වර්ගයේ තරාදි 01 |
| | | නිල්පාට ප්ලාස්ටික් බාල්දි 01 |
| 17. | 69618/19 | පාපැදි 02 |
| 18. | 38370/16 | ලුමාලා වර්ගයේ පාපැදි 01 |
| 19. | 9533/14 | උදලු 01 |
| | | කුඩා අලවංගු 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| | | පොඩි කුඩ 02 |
| | | කැට කුඩ 01 |
| | | බාල්දි 01 |
| 20. | 68133/19 | උදලු 01 |
| 21. | 31930/15 | ගැරුම් වට්ටි 01 |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| | | උදලු 01 |
| | | කුඩා අලවංගු 01 |
| 22. | 71160/20 | ගැරුම් වට්ටි 01 |
| | | වතුරු එන්ජින් 01 |
| | | අඩි 22 දිග අඟලේ ෆුඩ් වැලය සහිත බටය |
| | | වේවැල් කුඩ 01 |
| | | අඩි 02 දිග හෝස් බට කැබැල්ලක් |
| 23. | 68045/19 | උදලු 01 |
| | | කුඩ 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| 24. | 68440/12 | තරාදි 01 |
| 25. | 68434/12 | තරාදි 01 |
| 26. | 68432/12 | තරාදි 01 |
| 27. | 69759/19 | මුට්ටි 01 |
| 28. | 69757/19 | උදලු 01 |
| 29. | 69168/19 | සවල් 01 |
| 30. | 69295/19 | කුඩා අලවංගු 01 |
| | | ගැරුම් වට්ටි 02 |
| | | උදලු 01 |
| 31. | 70643/19 | කුඩා අලවංගු 01 |
| | | උදලු 01 |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| 32. | 70642/19 | වේවැල් කුඩ 01 |
| | | පනිට්ටු 01 |
| 33. | 44096/17 | ඉටි කොල පාර්සල් 01 |
| | | උදලු 01 |
| 34. | ඒ. ආර්. 1815/18 | උදලු 01 |
| | | සවල් 01 |
| 35. | 69758/19 | උදලු 01 |
| 36. | 70121/19 | සවල් 01 |
| 37. | 60473/18 | ප්ලාස්ටික් බේසම් 01 |
| 38. | 59779/19 | ගෑස් සිලින්ඩරය |
| | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප |
| | | ඇලුමිනියම් කල 01 |
| | | හට්ටි 01 |
| 39. | ඒ.ආර්.1938/19 | ප්ලාස්ටික් තාච්චි 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| 40. | 68890/19 | උදලු 01 |
| 41. | 69391/19 | කුඩා අලවංගු 01 |
| | | උදලු 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| 42. | 70434/19 | උදලු 01 |
| | | කුඩ 03 |
| | | අලවංගු 01 |
| 43. | ඒ. ආර්. 100/19 | රිම් එක සහිත යතුරුපැදි රෝදය |
| 44. | 64018/19 | විදුලි පන්දම් 01 |
| 45. | 64014/9 | විදුලි පන්දම් 02 |
| | | පාපැදිය |
| 46. | 56732/18 | විදුලි පන්දම් 01 |
| | | නයිලෝන් කඹ 01 |
| 47. | ඒ. ආර්. 893/19 | ජංගම දුරකතන 01 |
| 48. | 53731/18 | ඇලුමිනියම් කල 01 |
| 49. | 66518/19 | සවල් 01 |
| 50. | 8465/14 | විදුලි මෝටරය |
| 51. | 55813/18 | ඇලුමිනියම් කල 01 |
| 52. | 56756/18 | තැඹිලිපාට බාස්කට් 01 |
| 53. | 62072/19 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 54. | ඒ.ආර්. 140/20 | ගෑස් උදුන |
| 55. | 70873/20 | බාල්දි 01 |
| | | උදලු 02 |
| | | ප්ලාස්ටික් කල 01 |

| | | |
|---|---|---|
| 56. | 54989/18 | ඇලුමිනියම් කල 01 |
| 57. | 63994/19 | ඇලුමිනියම් හට්ටි 01 |
| 58. | 50779/17 | ඇලුමිනියම් හට්ටි 01 |
| 59. | 67780/19 | Spark 09 size පාවහන් යුගල 01 |
| 60. | 3082/14 | ප්ලාන්ට් 01 |
| | | අත් කියත් 02 |
| | | බෝල මිටි 01 |
| | | උල්කටු 05 |
| | | නියන් 01 |
| | | යතුකැට තල 01 |
| | | හැන්ඩ් ග්‍රිල් 01 |
| | | කපන කටු 03 |
| 61. | අංක රහිත | සාස්පෑන් සෙට් 02 |
| 62. | අංක රහිත | බාල්දි 01 |
| 63. | අංක රහිත | අංක රහිත සවල් 30 |
| 64. | අංක රහිත | තරාදි 01 |
| 65. | අංක රහිත | මුට්ටි 02 |
| 66. | අංක රහිත | කැට කුඩ 01 |
| 67. | අංක රහිත | ලණු කැරලි 02 |
| 68. | අංක රහිත | තරාදි 01 |
| 69. | අංක රහිත | ලයිට් එන්ජින් 01 |
| 70. | අංක රහිත | තට්ටුව නැති තරාදි 01 |
| 71. | අංක රහිත | තංගුස් ලණු 01 |
| 72. | අංක රහිත | ප්ලාස්ටික් බාල්දි 01 |
| 73. | අංක රහිත | පනිට්ටු 05 |
| 74. | අංක රහිත | අමානා ෂීට් 01 |
| 75. | අංක රහිත | පුනීලය |
| 76. | අංක රහිත | බැරල් 30 |
| 77. | අංක රහිත | අලවංගු 06 |
| 78. | අංක රහිත | ඇලුමිනියම් කල 03 |
| 79. | අංක රහිත | වයර් තොගය |
| 80. | අංක රහිත | බයිසිකල් පොම්පයක් |
| 81. | අංක රහිත | අත කොලුව |
| | | නියන |
| | | මුලු මට්ටම |
| 82. | අංක රහිත | බූලි 30 |

02-416

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල, නිට්ටඹුව

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2020.03.28 පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වෙන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දින එය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් නිසි අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදින ප. ව. 3.00 ට පෙර ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරුවන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය අවස්ථාවේ දී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී ඉදිරිපත් කළ භාණ්ඩ සම්බන්ධව අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

ඒ. එම්. එන්. පී. අමරසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල - නිට්ටඹුව.

2020 ජනවාරි මස 30 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වාහන මාදිලිය |
|---|---|---|---|

ලියාපදිංචි කළ හැකි

| | | | |
|---|---|---|---|
| 01. | 08691 | WP JH - 5411 | බජාජ් ත්‍රී රෝද රථය |
| 02. | 50886 | WP PV - 7522 | මැක්සිමෝ ප්ලස් ලොරි රථය |
| 03. | 20856 | NW PU - 3036 | ඩිමෝ බට්ටා ලොරි රථය |
| 04. | 93635 | WP HL - 8807 | සුසුකි බඩී ලොරි රථය |
| 05. | 18884 | NC PW - 6945 | ඩිමෝ බට්ටා ලොරි රථය |
| 06. | AR 911/19 | 120-6230 | හොණ්ඩා CG 125 යතුරු පැදිය |
| 07. | AR 914/19 | NW BCC 5513 | හොණ්ඩා ඩියෝ යතුරු පැදිය |
| 08. | AR 189/19 | HD - 8648 | බජාජ් CT 100 යතුරු පැදිය |
| 09. | AR 1167/19 | VN - 0605 | බජාජ් XCD 125 යතුරු පැදිය |
| 10. | 38357 | WP BDC - 8725 | හීරෝ ඩෑෂ් යතුරුපැදිය |

ලියාපදිංචි කළ නොහැකි

| | | | |
|---|---|---|---|
| 11. | 63488 | අංක රහිත සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටරය | |
| 12. | 68455 | WP QC 4754 | බජාජ් ත්‍රී රෝද රථය |
| 13. | AR 912/19 | WE - 4284 | යමටෝ යතුරු පැදිය |
| 14. | AR 190/19 | 129-0686 | මේට් 50 යතුරු පැදිය |
| 15. | AR 1169/19 | 156-3160 (158-0574) | යමහා DT 50 |
| 16. | AR 1168/19 | WR - 8855 | JIALING |
| 17. | 56032 | 157 - 0416 | හොණ්ඩා MD 90 යතුරු පැදිය |
| 18. | AR 3041/17 | අංක රහිත යතුරු පැදිය | හොණ්ඩා CM 125 යතුරුපැදිය |
| 19. | AR 3041/17 | අංක රහිත යතුරු පැදිය | වර්ගය හදුනාගත නොහැක |
| 20. | AR 3041/17 | 112-0732 | හොණ්ඩා CD 90 යතුරු පැදිය |

02-386

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - රම්බඩගල්ල

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රම්බඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2020.03.05 වැනි දින පෙ. ව. 8.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ එදින පෙ. ව. 8.00 සිට 8.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට හැකි ය.

03. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේනම් එදින පෙ. ව. 8.30 ට පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් ගෙවිය යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතුන් මත මෙම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ එදිනම ප. ව. 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
රඹඩගල්ල.

2020 පෙබරවාරි මස 06 වැනි දින,
රඹඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2020.03.05 දිනැති ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ලියාපදිංචි කිරීමේ හැකියාව* |
|---|---|---|---|
| 01 | 24517/18 | අංක 270 - 2487 දරන ට්‍රැක්ටරය | ලියාපදිංචි කළ නොහැකිය |
| 02 | 24517/18 | අංක NW RX 7236 දරන ටේලරය | ලියාපදිංචි කළ නොහැකිය |
| 03 | 16394/14 | ෂී පැන් වර්ගයට අයත් ට්‍රැක්ටරය හා ඊට ඈඳන ලද ටේලරය | ලියාපදිංචි කළ නොහැකිය |
| 04 | 16263/14 | ෂී පැන් වර්ගයට අයත් ට්‍රැක්ටරය හා ඊට ඈඳන ලද ටේලරය | ලියාපදිංචි කළ නොහැකිය |
| 05 | 16498/14 | අංක 1710 දරන නිල් පැහැති ටිපර් රථය | ලියාපදිංචි කළ නොහැකිය |
| 06 | 14606/13 | අංක 227 - 2497 දරන ලොරි රථය | ලියාපදිංචි කළ හැකිය |
| 07 | 26785/18 | අංක NW XO 8750 දරන යතුරු පැදිය | ලියාපදිංචි කළ හැකිය |
| 08 | 26742/18 | අංක 48 -6828 දරන ටිපර් රථය | ලියාපදිංචි කළ හැකිය |
| 09 | 25667/18 | අංක NW LM 1718 දරන නිල් පැහැති ටිපර් රථය | ලියාපදිංචි කළ හැකිය |

02-499

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නැගෙනහිර සිංගප්පූරුවේ 608828, ටෝ ගුආන් පාරේ (Toh Guan Road) 5C හි දැනට ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 02, පාර්ක් වීදිය, අංක 33, පාර්ක් ගොඩනැගිල්ලේ, ලෙවල් 12 දරන ස්ථානයේ ලියාපදිංචි කළ ශාඛා කාර්යාලය පිහිටි සිංගප්පූරුවේ නිසි පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන නිපෝන් එක්ස්ප්‍රස් (සවුත් ඒෂියා සහ ඕෂනියා) පීටීඊ ලිමිටඩ් (Nippon Express (South Asia & Oceania) Pte. Ltd.) (ලියාපදිංචි අංක 201204771W) හි එකම අධ්‍යක්ෂවරයා වන දැනට සිංගප්පූරුවේ 237995, # 6-20, රෝබට්සන් වෝක්, යුනිටි වීදියේ අංක 11 හි පදිංචි ෂින්ජිරෝ ටකේසෝ Shinjiro Takezoe වන මා විසින් කොළඹ 02, පාර්ක් වීදියේ, අංක 33,# 1229 පාර්ක් ගොඩනැගිල්ලේ, ලෙවල් 12 හි පදිංචි මසාඕ උමේමොටො (Masao Umemoto) වෙත ප්‍රදානය කරන ලද 2016 ජූලි මස 11 වන දිනැති සිංගප්පූරුවේ ප්‍රසිද්ධ නොතාරිස් එල්. කුප්පන්චෙට්ටි විසින් ලියා සහතික කළ ඇටෝර්නි බලපත්‍රය 2019 ඔක්තෝබර් මස 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන බව එකී ජනරජයේ මහජනතාව සහ ආණ්ඩුව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෂින්ජිරෝ ටකේසෝ (Shinjiro Takezoe)

02-361

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

හක්මණ ගංගොඩගම, සමන්, අංක 15/2 හි පදිංචි ජා. හැ. ප. අංක 840960498 V හිමි ලොකු මුණසිංහගේ රෝහිත සමන් කුමාර වන මම ප්‍රසිද්ධ නොතාරිස් නිලංග සෙනෙවිරත්න මහතාගේ අංක 1813 සහ 2019.08.16 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් පුහුල්වැල්ල, වලකන්ද, ප්‍රියංකර හි පදිංචි ජා. හැ. ප. අංක 858480388 V හිමි හේවා කංකානම්ගේ සුරංගි නදීෂානි යන අයට ලබාදුන් ඇටෝර්නි බලය වර්ෂ 2020.02.20 දිනයෙන් අහෝසි වන බව සියල්ලෝ ම දැනගනිත්වා.

ලොකු මුණසිංහගේ රෝහිත සමන් කුමාර.

02-458

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බත්තරමුල්ල, තලංගම උතුර, මුවන්හැලවත්ත, අංක 648/12 හි පදිංචිව සිට දැනට එංගලන්තය, SM6 9LQ, වොලින්ටන්, සන්කිස්ට් වේ, අංක 02 හි පදිංචි රෝහිණී චන්ද්‍රලතා වීරසිංහ නොහොත් නවසිව මුදියන්සේලාගේ රෝහිණී චන්ද්‍රලතා වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වගනම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් කිව්පති, ශාස්ත්‍රපති පූජ්‍ය පන්නල ඤාණාලෝක ස්ථවිරයන් යන අය පත් කරමින් දෙන ලද, අංක 714 සහ වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් මස 29 වැනි දින දරන එම්. වී. හෙට්ටිගේ ගම්පහ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 222 කාණ්ඩයේ 05 පත්ඉරුවේ 606 දිනපොත් අංකය යටතේ 2018.01.11 දාතම යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

තවද, ඉහත කී කිව්පතිල ශාස්ත්‍රපති පූජ්‍ය පන්නල ඤාණාලෝක ස්ථවිරයන් විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමට යටත් නොවන බව ද දැනුම් දෙනු ලැබේ.

රෝහිණී චන්ද්‍රලතා වීරසිංහ නොහොත් නවසිව මුදියන්සේලාගේ රෝහිණී චන්ද්‍රලතා.

2020 පෙබරවාරි මස 06 වැනි දින.

02-459

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඔපස්සෙන්ටා ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 00206281
ලියාපදිංචි කාර්යාලය : අංක 18ඩී, ඇතුල් කෝට්ටේ පාර, කෙලින් වීදිය, බත්තරමුල්ල.
සංස්ථාගත කළ දිනය : 2018.11.14

සමාගම් ලේකම්.

02-612

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ, කල්‍යාණි පාර, දෙවන පටුමග, අංක 35/4 හි පදිංචි ජීවානි තුෂාරා කුමාරි අමරසේකර වන මා ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් ගම්පහ, කල්‍යාණි පාර, අංක 35/4 හි පදිංචි චිත්‍රා එලන් මෙන්ඩිස් (ජා. හැ. අංක 436062451 V) යන අය පත් කරමින් දෙන ලද අංක 2851 සහ 2015.10.16 වැනි දින දරන රජිතා ප්‍රසන්ති කුලතුංග නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 53 කාණ්ඩයේ 4 පත්‍රිඉරුවේ දින පොත් අංකය 26270 යටතේ 2015.11.18 දාතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

ජීවානි තුෂාරා කුමාරි අමරසේකර.

2020 ජනවාරි මස 22 වැනි දින.

02-367

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ, කල්‍යාණි පාර, දෙවන පටුමග, අංක 35/4 හි පදිංචි තිලිණි ප්‍රභා කුමාරි අමරසේකර වන මා ශ්‍රී ලංකා සමජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් ගම්පහ, කල්‍යාණි පාර, අංක 35/4 හි පදිංචි චිත්‍රා එලන් මෙන්ඩිස් (ජා. හැ. අංක 436062451 V) යන අය පත් කරමින් දෙන ලද අංක 2852 සහ 2015.10.16 වැනි දින දරන රජිතා ප්‍රසන්ති කුලතුංග නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 53 කණ්ඩයේ 53 පත්‍රිඉරුවේ දින පොත් අංකය 26269 යටතේ 2015.11.18 දාතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

තිලිණි ප්‍රභා කුමාරි අමරසේකර.

2020 ජනවාරි මස 14 වැනි දින.

02-368

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වේයන්ගොඩ, නයිවල සණස නගරය, අංක 89/37 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අ. 562936643 V හිමි රාමනායක පතිරැන්නැහැලාගේ සුසිල් ශාන්ත වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් වේයන්ගොඩ, කුඹල්ඔළුව, අංක 315/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජා. හැ. අ. 622772833 V රාමනායක පතිරැන්නැහැලාගේ නීල් ප්‍රේමරත්න යන අය පත් කරමින් විදේශයක දී ලියා සහතික කරන ලද ලිඛිත බලධාරිකම් සහ ඇටර්නි බලපත්‍ර පොතේ 30 කාණ්ඩයේ 65 පත් ඉරුවේ 1795 දින පොත් අංකය යටතේ 2017.07.12 දතම යටතේ ලියාපදිංචි ව ඇති විශේෂ ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවය.

රාමනායක පතිරැන්නැහැලාගේ සුසිල් ශාන්ත.

2020 ජනවාරි මස 14 වැනි දින.

02-384

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, කටුනේරිය තැපැල් වසමේ පහල කටුනේරිය හලාවත පාර අංක 97 දරන ස්ථානයේ පදිංචි පෝරුතොටගේ ස්ටැන්ලි ප්‍රනාන්දු වන මා විසින් කටුනේරිය ''සිසිල'' හි පදිංචි ඩබ්ලිව්. අයි. ඒ. ආර්. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2018.02.19 වැනි දින සහතික කළ අංක 1336 දරන බත්තරමුල්ල, පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 226 කාණ්ඩයේ 29 පත්‍රිඉරුවේ 3147 දරන දිනපොත් අංකය යටතේ ලියා පදිංචි වී ඇති ඇටර්නි බලපත්‍රයෙන් එකී කටුනේරිය තැපැල් වසමේ පහල කටුනේරිය අංක 97 දරන ස්ථානයේ පදිංචි තෙරෙස් කාන්ති දබරේරා යන අය මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකාරිය ලෙස පත්කර ඇති අතර, එම ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහ ජනතාවටත් මෙයින් දැනුම් දෙමි. ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය උපයෝගී කර ගනිමින් කරනු ලබන සියලු කටයුතු අවලංගු හා බල රහිත බව ද මෙයින් වැඩි දුරටත් දැනුම් දෙමි.

පෝරුතොටගේ ස්ටැන්ලි ප්‍රනාන්දු.

02-407

---

## දැන්වීමයි

2007 අංක 07 සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ට්‍රයිටෙක් සර්විසස් ඇන්ඩ් සොලූෂන්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී. වී. 00210827
දිනය : 2019.04.06
ලියාපදිංචි ලිපිනය : 238, මහරගම පාර, බොරලැස්ගමුව, මහරගම.

සමාගමේ අධ්‍යක්ෂ.

2019 අගෝස්තු මස 22 වැනි දින.

02-409

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ මර්වන්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය ෆයිසර්ව් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කර වර්ෂ 2020 ජනවාරි මස දෙවන දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ පෙර නාමය : මර්වන්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 61342
ලියාපදිංචි ලිපිනය : අංක 116/10, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07
සමාගමේ නව නාමය : ෆයිසර්ව් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරු : සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 116/10, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

02-411

---

### ඇටර්නි බලය අවලංගු කිරීමයි

පිලාන, මොරගල හන්දිය, කන්කානම්ගෙ වත්ත හි පදිංචි දිනූෂා රණතුංග (ජා. හැ. අ. 866453551 V) වන මම ගාල්ල, චීනකොරටුව, අංක 10 හි පදිංචි මුණසිං පතිරණ පල්ලියගේ තීක්ෂණ නවීන් මධුෂංක (ජා. හැ. අ. 873522062 V) වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ජයන්ති හේනෙගොඩ විතානාච්චි මහත්මිය විසින් වර්ෂ 2019.02.04 වැනි දින ලියා සහතික කරන ලද අංක 2042 දරන සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට මුණසිං පතිරණ පල්ලියගේ තීක්ෂණ නවීන් මධුෂංක මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මම වග නොකියන බව මෙයින් දන්වා සිටිමි.

දිනූෂා රණතුංග.

02-412

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

HNB 48 -19 (i)

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - යක්කලමුල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එස්. මල්ෂානි විසින් ලියා සහතික කරන ලද අංක 1749 හා 2017.06.30 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නම්බුකාර වසම් වක්වැල්ල ගමගේ ධනේෂ් දුෂ්මන්ත විසින් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2020 ක් වූ මාර්තු මස 13 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ 177 එෆ් තේලලඹුර දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙල්ලඹුර ගමේ පිහිටි ලොට් ඒ 3 වශයෙන් සඳහන් කර ඇති එකට යාවූ ඉඩම් තුනකින් සමන්විත වූ දෙනියගොඩවත්ත කැකිල්ලවත්ත දෙනිය සහ කොහිලගොඩ වත්තේ ලොට් 1 හෙවත් කැකිල්ලගොඩ හෙවත් දෙනියද්දරවත්ත කනත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද

අංක 8652 හා 2016.12.04 දින දරන පිඹුරේ ලොට් ඒ3ඒ වශයෙන් දැක්වෙන බෙද වෙන් කරන ලද පර්චස් තිස් හතරයි දශම හයයි පහ (අ. 0 රූ. 0 පර්. 34.65) හෙවත් හෙක්ටයාර් 0.08764 ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති පස, ගොඩනැගිලි, ගහකොළ පළතුරු ඇතුළු සෑම සියලු දේ ද වේ.

2. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ 177එෆ් තෙල්ලඹුර දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙල්ලඹුර ගමේ පිහිටි ලොට් ඒ 3 වශයෙන් සඳහන් කර ඇති එකට යාවූ ඉඩම් තුනකින් සමන්විත වූ දෙනියගොඩවත්ත කැකිල්ලවත්ත දෙනිය සහ කොහිලගොඩවත්තේ ලොට් 1 හෙවත් කැකිල්ලගොඩ හෙවත් දෙනියද්දරවත්ත කනත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද අංක 8652 හා 2016.12.04 දින දරන පිඹුරේ ලොට් ඒ 3 බී වශයෙන් දැක්වෙන බෙද වෙන් කරන ලද පර්චස් හතලිස් හයයි දශම තුනයි පහ (අ. 0 රූ. 0 පර්. 46.35) හෙවත් හෙක්ටයාර් 0.11722 ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගොඩනැගිලි ගහකොළ, පළතුරු ඇතුළු සෑම සියලු දේ ද වේ.

පහත දැක්වෙන ඉඩම මතින් මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී ලොට් ඒ 3 වශයෙන් සඳහන් කර ඇති එකට යාවූ ඉඩම් තුනකින් සමන්විත වූ දෙනියගොඩ වත්ත කැකිල්ලවත්ත දෙනිය සහ කොහිලගොඩවත්තේ ලොට් 1 හෙවත් කැකිල්ලගොඩ හෙවත් දෙනියද්දරවත්ත කනත්ත නමැති ඉඩමට ඉහත කී අංක 8652 දරන පිඹුරේ ලොට් ඒ 3 සී වශයෙන් දැක්වෙන බෙද වෙන් කරන ලද පර්චස් හයයි දශම එකයි හතර (අ. 0 රූ. 0 පර්. 6.14) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.12.06 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.12.09 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - යක්කලමුල්ල නගරයේ සිට මාකුඹුර පාරේ කි. මී. 1.6 ක් මාකුඹුර හන්දිය දක්වා පැමිණ දකුණට හැරී උඩුගම පාරේ කි. මී. 1.8 ක් පැමිණි පසු දේපළට ළඟා විය හැක. අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියය (රු. 1,500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011- 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක : 091- 2277105, 0779-663420.
ඊමේල් : ejayawardhana 77@gmail.com

02-450

---

HNB 48 -19 (ii)

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - යක්කලමුල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

## 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එස්. මල්ෂානි විසින් ලියා සහතික කරන ලද අංක 911 හා 2015.06.10 දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නම්බුකාර වසම් වක්වැල්ල ගමගේ ධනේෂ් දුෂ්මන්ත විසින් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2020 ක් වූ මාර්තු මස 13 වැනි දින ප. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා

සීමාව තුළ යක්කලමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බෙරණගොඩ ගමේ පිහිටි කොත්තගහමුල්ල හෙවත් හේනියා වතුරවල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. වී. කොටඹගේ මහතා විසින් සාදන ලද අංක 614 හා 2007.08.12 වැනි දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) *හෙවත්* හෙක්ටයාර් 0.0505 ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ පළතුරු ඇතුළු සෑම සියලු දේ ද වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.12.06 වැනි දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2019.12.09 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - යක්කලමුල්ල බස් නැවතුම් පොල සිට අකුරුස්ස පාරේ මීටර් 200ක් පමණ ඉදිරියට ගමන් කළ පසු දේපළට ළඟාවිය හැක. අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියය (රු. 1,500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011- 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක : 091- 2277105, 0779-663420
ඊ මේල් : ejayawardhana 77@gmail.com

02-451

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව කැන්ඩි කලර් සෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් ද හා සමරකෝන් මුදියන්සේලාගේ කුඹුරේගෙදර ප්‍රසන්න මංගල සමරකෝන් සහ සමරකෝන් මුදියන්සේලාගේ කුඹුරේගෙදර අසේල සංජීව සමරකෝන් යන අය බන්ධනදයින් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වන විකිණීම.* -

2020 ක් වූ මාර්තු මස 16 වැනි දින පෙ. ව. 10.30 ට

*දේපළ විස්තරය.* -

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත 719 - ගෝනවල දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ගෝනවල ගමේ පිහිටි වැලිගොඩපිටියේ දේවාලේගාවහේන දූන් වත්ත සහ වැලිගොඩපිටියේ සියඹලාගහමුලහේන දූන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. අමරසේන විසින් සාදන ලද අංක 1025 සහ 2007.10.14 වැනි දින දරන පිඹුරේ ලොට් 4 වශයෙන් දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස.

මැතකදී කරන ලද මැනීමකට අනුව ඉහත කී ගෝනවල ගමේ පිහිටි වැලිගොඩපිටියේ දේවාලේගාවහේන සහ දූන් වත්ත සහ වැලිගොඩපිටියේ සියඹලාගහමුලහේන දූන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංසරන්දෙනිය විසින් සාදන ලද අංක 8663 සහ 2014.08.26 වැනි දින දරන පිඹුරේ ලොට් 4 වශයෙන් දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් වේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 11.15

*2 වන විකිණීම.* - 2020ක් වූ මාර්තු මස 16 වැනි දින පෙ. ව. 10.45 ට

*දේපළ විස්තරය.* -

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ. කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත 719 ගෝනවල දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ ගෝනවල ගමේ පිහිටි වැලිගොඩපිටියේ දේවාලේගාවහේන සහ දූන් වත්ත සහ වැලිගොඩපිටියේ සියඹලාගහමුලහේන දූන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. අමරසේන විසින් සාදන ලද අංක 1025 සහ 2007.10.14 දින දරන පිඹුරේ ලොට් 5 වශයෙන් දැක්වෙන බෙද වෙන්කරන ලද ඉඩම් කොටස.

මැතක දී කරන ලද මැනීමකට අනුව ඉහත කී ගෝනවල ගමේ පිහිටි වැලිගොඩපිටියේ දේවාලේගාවහේන සහ දූනට වත්ත සහ වැලිගොඩපිටියේ සියඹලාගහමුලහේන දූන් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංසරන්දෙනිය විසින් සාදන ලද අංක 8663 සහ 2014.08.26 දින දරන පිඹුරේ ලොට් 5 වශයෙන් දක්වෙන බෙද වෙන්කරන ලද ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් වේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් 01, පර්චස් 1.12

බලයලත් මිනින්දෝරු ජේ. අමරසේන විසින් සාදන ලද අංක 1025 සහ 2007.10.14 දින දරන පිඹුරේ ලොට් 3 දරන ප්‍රවේශ මාර්ගය මගින් සහ දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ.

*දේපළට පිවිසීම.* - මහනුවර නගරයේ සිට නුවර - මහියංගනය ප්‍රධාන පාරේ කි. මී. 15ක් පමණ කුඹුක්කඳුර පාර හන්දිය දක්වා ගමන්ගෙන දකුණට හැරී කුඹුක්කඳුර පාරට පිවිස එම පාරේ මීටර් 15ක් පමණ ගිය පසු අදළ දේපළ මෙම පාරට මායිම්ව දකුණු පසින් පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.07.19 දින රජයේ ගැසට් පත්‍රයද, 2019.07.31 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්), (4) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය, (5) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500, (6) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද, වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෝෂ්ඨ කළමණාකරු (වාණිජ අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-442

**හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී.- හෙට්ටිපොළ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 04 වන වගන්තිය ප්‍රකාරව වටිනා දේපළක් වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ විසින් පිළියෙල කරන ලද 2005.05.08 දිනැති අංක 1540A/2005 දරන පිඹුරුපතෙහි ලොට් අංක 02 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙද වෙන් කරන ලද ''පූර්ටන් වතුයාය නොහොත් තම්බියගම වත්ත'' ඉඩම එහි ඇති ගොඩනැගිලි ඇතුළු සියල්ල සමගම වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙව්මැදි හත්පත්තුව ගිරතලන කෝරලේ, පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල සීමාවේ, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තැන්ගොඩගෙදර ග්‍රාම නිලධාරි වසමේ, තම්බියගම ග්‍රාමයේ පිහිටා ඇති ලොට් අංක 01 ලෙස ඉඩම,

*ඊසාන දෙසින් :* ඉහත අංක 1540A/2005 සැලැස්මෙහි ලොට් අංක 01 කොටස සහ හෙට්ටිපොළ සිට කොටම්බපිටිය දක්වා ප්‍රාදේශීය සභා පාර - ඩොරතියගෙදර පාර,

*ගිනිකොන දෙසින් :* ආර් එම් දයා ශ්‍රියානිට අයත් තම්බියගම වත්ත

*නිරිතදිග දෙසින් :* ඒ. වෙන්ඩර්පූර්ටන් විසින් හිමිකම් කියන පූර්ටන් වතුයාය සහ අංක 1540A/2005 සැලැස්මේ ලොට් අංක 03 මගින්,

*වයඹ දෙසින් :* අංක 1540A/2005 සැලැස්මේ ලොට් අංක 01 මායිම් වී ඇත.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආර්. පී. ගාල්ලගේ හමුවේ 2018 මැයි 25 වැනි දින දිවුරුම් දූන් පරිදි අංක 3924 යන ණය උකස් බැඳුම්කරය සඳහා ගාර්දිවසම් බාලගේ අජිත් කුමාර ආරියදාස යන උකස්කරුවා විසින් උක්ත දේපළ සඳහා පොරොන්දු වූ පරිදි හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවීම් පැහැර හැර ඇත.

හැටන් නැෂනල් බැංකුව (පී. එල්. සී.) විසින් මා වෙත පවරන ලද බලය යටතේ, ඉහත සඳහන් කළ දේපළ 2020 මාර්තු මස 12 වන බ්‍රහස්පතින්ද දින පෙරවරු 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දූනුම් දෙමි.

*දේපළ සඳහා වූ ප්‍රවේශය.* -

හෙට්ටිපොළ නගර මධ්‍යයේ සිට වාරියපොළ මාර්ගය දිගේ කිලෝමීටර් 2.25 ක් පමණ කොටම්බපිටි හන්දිය දක්වා ඉදිරියට ගොස් නාරම්මල පාර දෙසට දකුණට හැරී ගොස් මෙම මාර්ගය දිගේ කිලෝමීටර් 1.1ක් පමණ ගොස් ශ්‍රී සුනන්දාරාම මාවත

දෙසට දකුණට හැරී කි. මී. 1.75ක් පමණ ගමන් කළ විට දේපළ මෙම මාර්ගයේ වම් පසින් පිහිටා ඇත.

නිවේදනය සඳහා කරුණාකර 2019 නොවැම්බර් මස 15 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* සහ 2019 නොවැම්බර් මස 19 වැනි දිනැති ඩේලි මිරර්, ලක්බිම සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන බළධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදල (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකිණීමේ මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇත්නම්,
6. විකිණීමේ සහතිකය සඳහා වූ මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත සඳහන් නිලධාරියාගෙන් පරීක්ෂා කර බැලිය හැක.

සහකාර සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්, හැටන් නැෂනල් බැංකුව (පී. එල්. සී.),

අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10
දුරකථන අංක : 011 2661816/ෆැක්ස් අංකය 2661835.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල
දුරකථන අංක 11 4367467, 11 4367111 aucslk@gmail.com

02-449